IHP
INSTITUTE FOR HEALTH POLICY

**72,** පාර්ක් වීදිය, කොළඹ**-2,** ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2024 අප්‍රේල් 18
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව. 03.00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# 2024 මාර්තු මාසයේදී සජිත් ප්‍රේමදාස කෙරෙහි හිතකරත්වය වර්ධනය වී ඇත, නමුත් අනුර කුමාර දිසානායක තවදුරටත් පෙරමුණ ගනී

*තවමත් පක්ෂ නායකයින් හතර දෙනාටම සෘණ අගයන් පවතී*

IHP SLOTS 2024 මාර්තු මස මත විමසීමේදී, ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාසගේ සමස්ත හිතකරත්ව ශ්‍රේණිගත කිරීම පෙර මාසයට සාපේක්ෂව මාර්තු මාසයේදී ලකුණු 30 කින් වැඩිව -30 දක්වා ලඟා වී ඇති අතර ජා.ජ.බ./ජ.විපෙ. නායක අනුර කුමාර දිසානායකගේ සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ හිතකර ශ්‍රේණිගත කිරීම පිළිවෙළින් -24 (-2) සහ -78 (+1) හි සාපේක්ෂව නොවෙනස්ව පවතියි.



එක් එක් මාසය සඳහා වන හිතකරත්ව ඇස්තමේන්තු පදනම් වන්නේ අවම ප්‍රතිචාර එකතුවක් සහතික කිරීම සඳහා එම මාසය තුළ දී සහ ඊට පෙර සහ පසු සති කිහිපයක් තුළ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 100-400ක් මත ය. 2023 මාර්තු මස ඇස්තමේන්තු සම්මුඛ සාකච්ඡා 401 (සජිත් ප්‍රේමදාස), 377 (අනුර කුමාර දිසානායක), 406 (රනිල් වික්‍රමසිංහ) සහ 145 (ගෝඨාභය රාජපක්ෂ) මත පදනම් වී ඇත.

**සංස්කාරකවරුන්ට සටහන**

ඇතැම් විට මහජනතාව මාධ්‍යය විසින් වාර්තා කරන මෙම සංඛ්‍යා වරදවා වටහා ගන්නා බව අපිට අවබෝධ විය. සෘණ ලකුණු, එනම්, ශුන්‍යයට වඩා අඩු සමස්ත හිතකරත්ව ශ්‍රේණිගත කිරීමකින් අදහස් වන්නේ එම පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි හිතකර මතයක් නොපවතින බවයි. ධනාත්මක ලකුණු පමණක්, එනම්, ශුන්‍යයට වඩා වැඩි සමස්ත හිතකරත්වයකින් අදහස් වන්නේ එම අදාල පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි හිතකර මතයක් පවතින බවයි.

## Related Reports


Institute for Health Policy, March 2024, “Favourability ratings of major party leaders declined in February 2024” Available at: https://ihp.lk/press-releases/favourability-ratings-major-party-leaders-declined-february-2024

Institute for Health Policy, February 2024, “AK Dissanayake sees favourability ratings improve, but other party leaders see declines in January 2024.” Available at: https://ihp.lk/press-releases/ak-dissanayake-sees-favourability-ratings-improve-other-party-leaders-see-declines

Institute for Health Policy, December 2023, “Sajith Premadasa’s favourability rating improved in November, but still trailed AK Dissanayake.” Available at: *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231215.pdf*

Institute for Health Policy, November 2023, “AK Dissanayake continues to see his favourability improve, while it worsens for other party leaders.” Available at: *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231117.pdf*

Institute for Health Policy, October 2023, “Favourability ratings of AK Dissanayake least negative of major party leaders in September.” Available at: *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231020.pdf*

Institute for Health Policy, September 2023, “AK Dissanayake’s public favourability improves, but Sajith Premadasa’s worsens in August.” Available at: *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230920.pdf*

Institute for Health Policy, August 2023, “Favourability of NPP/JVP leader AK Dissanayake sees significant drop in July 2023.” Available at: *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230816.pdf*

Institute for Health Policy, March 2023, “Sri Lankans continue to hold unfavourable views of all political party leaders. Most more unpopular than French President Macron, with only a few having a small positive rating.” *Available at: https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230328.pdf*

Institute for Health Policy, April 2022, “SLOTS Favourability Ratings: Methodology for tracking public favourability”, SLOTS Report #2022-03. *Available at: https://ihp.lk/publications/docs/SLOTSReport202203.pdf*

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියක්, SLOTS මඟින් සමීක්ෂණයට ලක් කරනු ලබයි. SLOTS මඟින් ප්‍රසිද්ධ චරිතයක් හෝ ආයතනයක් පිළිබඳව හිතකර හෝ අහිතකර මතයක් තිබේ දැයි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසීම තුළින් හිතකරත්වය නිරීක්ෂණය කරනු ලබයි: සමස්ත හිතකරත්වය යනු ධනාත්මක (+100) සහ සෘණාත්මක (-100) ප්‍රතිචාරවල සාමාන්‍යය වේ. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අංශය, පළාත සහ පසුගිය ඡන්ද මනාපය භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම ඇස්තමේන්තු නැවත සකස් කර ඇත. මාසික ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ සෑම මාසයකම සහ ඊට පෙර සහ පසු සතිවල කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ 100+ ක නියැදියක් මත ය. මාර්තු යාවත්කාලීනය සඳහා පෙර යාවත්කාලීනයට වඩා මෑත දත්ත කට්ටලයක් භාවිතා කරන බැවින්, පෙර මාස සඳහා හිතකරතව ශ්‍රේණිගත කිරීම් ඇස්තමේන්තු වලට වඩා කුඩා වෙනස්කම් ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයන ලදී. IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය දක්වයි. අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. තවද, සමීක්ෂණයේ සොයාගැනීම් හරහා අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.